00022

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

පෙර පාසල් අධ්‍යාපන උසස් සහතික පත්‍ර වැඩසටහන - 2014

පූර්ව ළමාවිය සමායෝගී වීමේ ගැටළු - ESC 2221

කාලය - පැය තුනයි.

---

දිනය 2014.10.25 | වේලාව - ප.ව. 01.30- ප.ව. 04.30 දක්වා

---

පළමු කොටසේ **සියලුම ප්‍රශ්නවලට** හා දෙවන කොටසේ **ඕනෑම ප්‍රශ්න (03) තුනකටත්** පිළිතුරු සපයන්න.

**I - කොටස**

01. මනා සමායෝගී වූ පෞරුෂය සහ සමායෝගී වීමේ ගැටළු සහිත පෞරුෂ අතර වෙනස්කම් උදාහරණ **දෙකක් (02)** ආශ්‍රිතව කෙටියෙන් පැහැදිලි කරන්න.

02. " 'මූලික විශ්වාසයට එරෙහිව අවිශ්වාසය' යන්න එරික් එරික්සන් විසින් හඳුන්වා දුන් මනෝ සමාජයීය සංවර්ධනයට අදාළ පළමු අවධියයි."
එරික්සන් දක්වන ලද මෙම අවධියේ ස්වභාවය සැලැකිල්ලට ගෙන දරුවන්ගේ මනෝ සමාජීය සංවර්ධනයට සහය සැළසීමෙහිලා මවගේ හෝ රැකබලාගන්නන්ගේ කාර්ය භාරය සාකච්ජා කරන්න.

03. 'ඉහ වහගිය කේන්තිය' යන්නෙහි ස්වභාවය කෙටියෙන් සාකච්ජා කර ඒ සඳහා බලපාන හේතු **දෙකක් (02)** සඳහන් කරන්න.

04. 'හැවිංග්හර්ට්ස් ඉදිරිපත් කළ මධ්‍යම ළමාවියට අදාළ සංවර්ධනාත්මක කාර්යයන් **පහක් (05)** ලැයිස්තු ගත කරන්න.

05. කරණ ආරෝපණ න්‍යායෙහි විස්තර වන ආකාරයට ළමයින් ගැටළු සහගත චර්යාවන් ඉගෙන ගන්නේ කෙසේදැයි උදාහරණ **දෙකක්** (02) ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

06. ළමයින්ගේ සංවර්ධනයට බලපෑ හැකි පරිසරාත්මක බාධක **පහක් (05)** ලැයිස්තුගත කරන්න.

07. ළමයින් ආයතනගත වීම සඳහා බලපෑ හැකි සාධක **තුනක්** (03) පැහැදිලි කරන්න.

08. 'ළමයින් පෙන්නුම් කරන සමහර සමායෝගී ගැටළු සඳහා නිශ්චිත හේතුවක් සොයා ගැනීම දුෂ්කරය.'
උදාහරණ **දෙකක් (02)** ආශ්‍රයෙන් උක්ත ප්‍රකාශය සනාථ කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## II කොටස

09. i. 'සෑම පෙරපාසල් ගුරුවරයෙකුටම කුඩා දරුවන්ගේ සමායෝගී ගැටළු පිළිබඳ දැනුමක් තිබිය යුතුය' උදාහරණ ආශ්‍රයෙන් උක්ත ප්‍රකාශය පරීක්‍ෂා කරන්න. (ලකුණු 10)

ii. අධික ලැජ්ජාශීලී ළමයෙකු පන්ති කාමර ක්‍රියාකාරකම් සඳහා සහභාගී කරවීමට ඔබ මැදිහත් වන්නේ කෙසේ ද? (ලකුණු 10)

10. i. සිග්මන් ෆ්‍රොයිඩ් සමායෝගී වීමේ ගැටළු පිළිබඳ ඉදිරිපත් කළ න්‍යායාත්මක අදහස් සාරාංශගත කරන්න. (ලකුණු 10)

ii. 'සමායෝගී වීම ගැටළු සඳහා බලපාන හේතු බහුවිධ මුහුණුවරක් ගනී. එබැවින් එම ගැටළු විශ්ලේෂණය කිරීමේ දී එක් න්‍යායකට පමණක් සීමා වීම ඵලදායී නොවේ.' උක්ත ප්‍රකාශය උදාහරණ ආශ්‍රයෙන් සනාථ කරන්න. (ලකුණු 10)

11. i. ළමයින්ගේ සමායෝගී ගැටළු ඇතිවීමට බලපෑ හැකි හේතු පිළිබඳ දෙමාපියන් දැනුවත් කිරීමේ වැදගත්කම සාකච්ජා කරන්න. (ලකුණු 10)

ii. සමායෝගී වීමේ ගැටළු සහිත ළමයින් සමඟ කටයුතු කිරීම සම්බන්ධව පෙර පාසල් ගුරුවරයෙකු වශයෙන් ඔබ දෙමාපියන්ට උපදෙස් දෙන්නේ කෙසේ ද? කුඩා ළමයින්ට පොදු සමායෝගී වීමේ ගැටළු අවම වශයෙන් **තුනක් (03)** ක් වත් පිළිබඳ සැලකිලිමත් විය යුතුය. (ලකුණු 10)

12. i. ළමයින්ගේ චර්යා හැඩ ගැන්වීමෙහි ලා භාවිතා කළ හැකි ප්‍රධාන ක්‍රම **දෙකක් (02)** පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. හිතකර නොවන චර්යා හැඩගැන්වීමට අදාළ මූලික පියවර මොනවා ද? (ලකුණු 10)

13. පහත දැක්වෙන ඕනෑම **දෙකක් (02)** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

1. සම්භාව්‍ය ආරෝපණ න්‍යාය පන්ති කාමරය තුළ භාවිතය
2. දැඩි පාලනයක් යටතේ ළමයින් හදාවඩා ගන්නා දෙමාපිය ශෛලිය සහ පාලනයේ නම්‍යතාවයක් පවතින දෙමාපිය ශෛලිය
3. කුඩා ළමයින්ගේ සමාජ හා චිත්තවේගික සංවර්ධනයෙහි ලා රූපවාහිනියේ බලපෑම
4. කුඩා ළමයින් ආයතනගත කිරීම. (ලකුණු $10 \times 2 = 20$)

හිමිකම් ඇවිරිණි.

00022

**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**FACULTY OF EDUCATION**
**FINAL EXAMINATION – 2014**
**ADVANCED CERTIFICATE IN PRE-SCHOOL EDUCATION PROGRAMME**
**ESC2221– ADJUSTMENT PROBLEMS IN EARLY CHILDHOOD**
**DURATION – THREE (03) HOURS.**

---

Date: 25th October 2014 Time: 1.30 p.m. – 4.30p.m.

---

Answer all questions in **Part I** & three (03) questions from **Part II**.

## PART I

01. Citing **two (02)** examples, briefly explain the difference between 'well adjusted personality" and "personality with adjustment problems"

02. "Basic Trust versus Basic Mistrust' is the 1st stage of psychosocial development introduced by Eric Ericson".

    Considering the nature of this stage as discussed by Ericson, discuss the role of mother/care giver in supporting psychosocial development of infants.

03. Briefly discuss the nature of "Temper Tantrums" and give **two (02)** reasons for temper tantrums.

04. List out **five (05)** developmental tasks in middle childhood as presented by Havingurst.

05. Citing two examples, explain how children learn problematic behaviours as described by operant conditioning theory.

06. List out **five (05)** environmental barriers which affect the development of children.

07. Explain **three (03)** factors which affect for institutionalization of children.

08. 'It is difficult to analyze the exact causes of some adjustment difficulties shown by children'.

    Citing **two (02)** examples justify the above statement.

(5 x 8 = 40 marks)

## PART II

09. i. "Every pre-school teachers should have knowledge about adjustment problems in young children" Citing examples examine this statement.

(10 marks)

ii. How do you intervene for a child who has excessive shyness to get the participation in class room activities.

(10 marks)

10. i. Summarize the theoretical views on adjustment problems presented by Sigmund Fraud.

(10 marks)

ii. 'The causes for adjustment problems are multi facet. Therefore is ineffective in confining only one theory when analyzing adjustment problems in children. Justify the above mentioned statement with examples.

(10 marks)

11. i. Discuss the importance of making aware the parents on possible reasons for adjustment problems of children.

(10 marks)

ii. As a pre-school teacher how do you advice parents to handle their children who have adjustment problems in a positive manner. You need to consider at least **three (03)** adjustment problems common to young children.

(10 marks)

12. i. Explain **two (02)** main methods of modification of behaviours of children.

(10 marks)

ii. What are the basic steps of modification of behaviours which are undesirable.

13. Writ short notes on any **two (02)** of the following.

i. Application of classical conditioning theory in the class room.

ii. Authoritarian parents and Authoritative parents.

iii. Influence of the television in emotional and social development of young children.

iv. Institutionalization of young children.

(10 x 2 = 20 marks)

- *Copyright reserved -*